දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்விநிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE& CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

# ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) : 2015

## ECG 1 : ආර්ථික විද්‍යාව I

- කාලය **පැය තුනයි**
- එක් කොටසකින් අඩු තරමින් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න
- ප්‍රස්ථාර කොල සපයනු ලැබේ. ගණක යන්ත්‍ර භාවිතාකල හැක
- මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.

---

### I වන කොටස

1. මාසික ආදායම රු. 84.00 ක් ලබන පාරිභෝගිකයෙකුට X සහ Y භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍යව ඇත. ඒවායෙහි මුළු උපයෝගිතා ශ්‍රිත පහත සමීකරණ මගින්දී ඇත.

$$TU_x = 92X - 2X^2$$
$$TU_y = 40Y - 2Y^2$$

X ඒකකයක මිල රු. 20/= ක්ද, Y ඒකකයක මිල රු. 4/= ක්ද වේයැයි සිතන්න

i. පාරිභෝගිකයාගේ සමතුලිත මිලදී ගැනීම් ගණනය කරන්න (ලකුණු 8)

ii. භාණ්ඩ දෙකෙහි ආන්තික ආදේශන අනුපාතිකය ($MRS_{xy}$) කුමක්ද? සමතුලිතයේදී එහි අගය ගණනය කරන්න (ලකුණු 4)

iii. සමතුලිතතාවයේදී මුදල් ඒකකයක ආන්තික උපයෝගිතාවය ගණනය කරන්න. (ලකුණු 3)

iv. අනෙකුත්දේ ස්ථාවරව තිබියදී පාරිභෝගික ආදායම රු. 188/= කින් වැඩිවීයැයි සිතන්න. එවිට ඔහුගේ නව සමතුලිත මිලදී ගැනීම් කුමක්විය යුතුද? (ලකුණු 5)

2. i. ඉල්ලුම් නීතිය පැහැදිලි කොට ඉල්ලුම් වක්‍රය කෙරෙහි එහි සම්බන්ධය පහදන්න. (ලකුණු 5)

ii. හීනවන ආන්තික උපයෝගිතා නියමය සහ ඉල්ලුම් නීතිය අතර සම්බන්ධය පැහැදිලි කරන්න. (ලකුණු 5)

iii. මුළු උපයෝගිතාව සහ ආන්තික උපයෝගිතාව අතර සම්බන්ධය විස්තර කරන්න. (ලකුණු 5)

iv. පාරිභෝගික ඉල්ලුම් න්‍යාය සඳහා වන සංඛ්‍යා සූචක සහ ක්‍රම සූචක උපයෝගිතා ප්‍රවේශයන්හි පවතින මූලික වෙනස කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 5)

3. පහත දැක්වෙන්නේ X භාණ්ඩය සඳහා වන නිෂ්පාදන ශ්‍රිතයයි

$Q = 10L^{0.4}K^{0.6}$ එහි Q මගින් X නිෂ්පාදන ප්‍රමාණයද, K සහ L මගින් පිළිවෙලින් භාවිතා කරනු ලබන ප්‍රාග්ධන ප්‍රමාණය හා ශ්‍රම ප්‍රමාණයද දක්වයි.

i. ඉහත නිෂ්පාදන ශ්‍රිතය භාවිතයෙන් ප්‍රාග්ධනයෙහි හා ශ්‍රමයෙහි ආන්තික සහ සාමාන්‍ය ඵලදායිතා ශ්‍රිත ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 6)

ii. ශ්‍රමය සහ ප්‍රාග්ධන ඒකකයක මිල පිළිවෙලින් රු. 20/= ක් සහ රු. 30/= ක්ද, අයවැය සංරෝධකය රු. 1000/= වේයැයි සිතන්න. නිෂ්පාදන සමතුලිතයේදී භාවිතා කලහැකි ප්‍රශස්ථ ශ්‍රම සහ ප්‍රාග්ධන ඒකක ප්‍රමාණය සොයන්න. (ලකුණු 6)

iii. භාවිතා කරනු ලබන ප්‍රාග්ධන සහ ශ්‍රම ප්‍රමාණයන් 50% කින් වැඩි කලහොත් නිෂ්පාදන මට්ටමට කුමක් සිදුවේද? (ලකුණු 4)

iv. නිෂ්පාදන ශ්‍රිතයෙහි සංගුණක (0.4 සහ 0.6) ඔබ විස්තර කරන්නේ කෙසේද? (ලකුණු 4)

4. i. ආන්තික හා සාමාන්‍ය නිෂ්පාදන වක්‍ර සහ ආන්තික හා සාමාන්‍ය පිරිවැය වක්‍ර අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 5)
ii. ආයතනයක දිගුකාලීන සාමාන්‍ය මුළු පිරිවැය එහි කෙටිකාලීන සාමාන්‍ය මුළු පිරිවැය හා සම්බන්ධවන ආකාරය ප්‍රස්ථාරයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 5)
iii. ඒකාධිකාරී තරඟය යනු පූර්ණ තරඟය සහ ඒකාධිකාරය අතර පවතන මධ්‍ය තත්වයකි. ප්‍රස්ථාර ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 10)

5. පහත දැක්වෙන ඒවා පිළිබඳව කෙටි සටහන් ලියන්න.
i. සාමාන්‍ය භාණ්ඩයක මිල වෙනස්වීමක ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාකයන්
ii. මිල පරිභෝජන වක්‍රය (PCC) සහ සාමාන්‍ය භාණ්ඩයක පරිභෝජන ඉල්ලුම් වක්‍රය
iii. හීනවන ආන්තික ශිල්පීය ආදේශන අනුපාතික නියමය
iv. ඒකාධිකාරී තරඟය යටතේ ආයතනයක ධාරිතා භාවිතය (capacity utilization)
(කොටසකට ලකුණු 5 බැගින්)

## II වන කොටස

6. ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු ලබාදී ඇත. (වටිනාකම් රු. මිලියනවලිනි)

| | | | |
|---|---|---|---|
| පරිභෝජන ශ්‍රිතය | $C = 100 + 0.8Y^d$ | රජයේ වියදම | $G = 125$ |
| පෞද්ගලික ආයෝජන | $I = 225$ | අපනයන | $X = 200$ |
| බදු අනුපාතය | $tY = 0.25Y$ | ආනයන | $M = 280 + 0.1Y$ |
| සංක්‍රාම ගෙවීම් | $TR = 100$ | | |

i. සමතුලිතයේදී පවතින ජාතික ආදායම, පරිභෝජන වියදම සහ ඉතුරුම් ගණනය කරන්න (ලකුණු 6)
ii. සමතුලිතයේදී විදීම් සහ කාන්දුවීම් සමාන බව පෙන්වන්න (ලකුණු 4)
iii. ආයෝජන රු. 275 දක්වා වැඩි කලේයැයි සිතන්න. නව සමතුලිතයේදී ජාතික ආදායම, පරිභෝජනය සහ ඉතුරුම් ගණනය කරන්න (ලකුණු 6)
iv. පැරණි සහ නව සමතුලිතයේදී රාජ්‍ය අයවැය ශේෂයන් ගණනය කරන්න (ලකුණු 4)

7. i. 'මුදල් ගුණකය' පැහැදිලි කරන්න. ඒ සඳහා බලපාන සාධක මොනවාද? (ලකුණු 5)
ii. මුදල් සැපයුම් ප්‍රමාණය (M) සහ මිල මට්ටම අතර සම්බන්ධතාවය ෆිෂර්ගේ මුදල් ප්‍රමාණවාදී න්‍යාය මත පදනම්ව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)
iii. කේම්බ්‍රිජ් සමීකරණය මුදල් ඉල්ලුම් සමීකරණයක් ලෙස ප්‍රකාශ කරන්නේ කෙසේද? (ලකුණු 5)
iv. මුදල් සැපයුම් ප්‍රමාණය (M) රු. 7000 bn, මිල මට්ටම රු. 2/=ක් සහ ද.ජා.නි. (GDP) රු. 14,000 bn වේයැයි සිතන්න. එහිදී මුදලේ ප්‍රවේගය සහ ද.ජා.නි.න් (GDP) මුදල් ලෙස තබා ගන්නා කොටස (ප්‍රතිශතය) කුමක්ද? (ලකුණු 5)

8. i. නිරපේක්ෂ වාසි සහ සාපේක්ෂ වාසි න්‍යායන් අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 8)
ii. "රටවල් අතර වෙළඳාම (වෙළඳ රටාව) තීරණය වන්නේ නිරපේක්ෂ වාසි නිසා නොව සාපේක්ෂ වාසි හේතුවෙනි." සාකච්ඡා කරන්න (ලකුණු 12)

9. i. නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයෙහි වාසි සහ අවාසි පැහැදිලි කරන්න (ලකුණු 10)
ii. විනිමය අනුපාතික ක්‍රමයක් ඇතිකර ගැනීමට සහ එය පවත්වා ගැනීමෙහිලා බ්‍රෙටන්වුඩ් ක්‍රමයෙහි කාර්යභාරය පැහැදිලි කරන්න (ලකුණු 10)

10. පහත දැක්වෙන ඒවා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ස්වාධීන (autonomous) වියදම් සහ පෙළඹවුණු (induced) වියදම්
ii. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
iii. ආදායම් ගුණකය නිර්ණයවීම/තීරණයවීම
iv. උද්ධමනාත්මක සහ අවධමනාත්මක පරතරය (කොටසකට ලකුණු 5 බැගින්)

---

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

# GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - (August 2015)

සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර)

## ECG 2: Economics / ආර්ථික විද්‍යාව II

උපදෙස්:

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න
මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුලු ප්‍රශ්න සංඛ්‍යාව අටකි

කාලය පැය තුනයි

---

1. " නූතනත්වය, යුරෝපා ආර්ථික සංවර්ධන ඉතිහාසයේ ඉතා වැදගත් වූ අවස්ථාවකි"
   - i. ඉහත වගන්තියේ සඳහන් නූතනත්වය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04යි)
   - ii. මෙම සන්දර්භය තුළ නූතනත්වයේ ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06යි)
   - iii. බටහිර යුරෝපා ආර්ථික සංවර්ධනයේදී නූතනත්වයේ කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

2. දහ නවවන හා දහ අටවන ශතවර්ෂවල මහා බ්‍රිතාන්‍යයේ කාර්මීකරණ ක්‍රියාවලියට කෘෂිකාර්මික විප්ලවයේ දායකත්වය අගයමින් සාකච්ඡා කරන්න. (ලකුණු 20යි)

3. i). දහ අටවන ශත වර්ෂයේ අග භාගයේ සිට මහා බ්‍රිතාන්‍යයේ කාර්මික අංශයේ සිදු වූ සංවර්ධන ක්‍රියාවලිය විස්තර කිරීමට "කාර්මික විප්ලවය" යන යෙදුම කොතරම් සුදුසුද? (ඔබේ පිළිතුර අවශ්‍ය තරම් විස්තරාත්මක විය යුතුය) (ලකුණු 10යි)

   ii). මහා බ්‍රිතාන්‍යයේ කාර්මික පරිවර්තනයේදී කපු රෙදිපිළි කර්මාන්තය ආශ්‍රිත තාක්ෂණික සොයාගැනීම්වල වැදගත්ම හා කාර්යභාරය කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

4. "සොල්වරිනය, ජර්මනියේ දේශීය කර්මාන්ත නිමවුම් සඳහා ශක්තිමත් දේශීය වෙළෙඳ පලක් නිර්මාණය වීමට පදනමක් සපයන ලදී" සාකච්ඡා කරන්න. (ලකුණු 20යි)

5. දහ නවවන ශත වර්ෂය තුළ මහා බ්‍රිතාන්‍යයේ හා ප්‍රංශයේ ක්‍රියාත්මක වූ කෘෂිකාර්මික අංශ අතර පවතින සමානකම් / අසමානකම් විශ්ලේෂණය කරන්න. (ලකුණු 20යි)

6. දහ නවවන ශත වර්ෂයේදී ප්‍රංශයේ සිදු වූ ප්‍රධාන ජන විද්‍යාත්මක වෙනස්කම් විභාග කරන්න. එය ප්‍රංශයේ කාර්මික සංවර්ධනය කරෙහි බලපෑ ආකාරය දක්වන්න. (ලකුණු 20යි)

7. සෝවියට් රුසියාවට ලෙනින් හඳුන්වාදුන් නව ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. රුසියානු ආර්ථිකයට එයින් සිදු වූ බලපෑම අගයන්න. (ලකුණු 20යි)

8. පහත සඳහන් ඕනෑම <u>හතරක්</u> සඳහා කෙටි සටහන් ලියන්න.
   - i). දෙවන ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය
   - ii). 1815 ධාන්‍ය නීති
   - iii). යුධ කොමිනියුස්ට්වාදය
   - iv). වානිජවාදය
   - v). නොර්ෆොර්ක් ක්‍රමය

(ලකුණු 4 x 5 = 20)

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

# ශාස්ත්‍රවේදි සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය (අගෝස්තු 2015)

## ආර්ථික විද්‍යාව 111

## ECG 3 ව්‍යවහාරික ආර්ථික විද්‍යාව

ඕනෑම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයෙහි ඇති ප්‍රශ්න සංඛ්‍යාව 10කි.
එක් එක් ප්‍රශ්නයට අදාළ ලකුණු දක්වා ඇත .
(පැය තුනයි)

1. (i) ශ්‍රී ලංකාවේ සමාජ සුබසාධන ප්‍රතිපත්තිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)
   (ii) සමාජ සුබසාධන වැඩසටහන්හි වැදගත්කම දක්වන්න. (ලකුණු 05)
   (iii) සමාජ සංවර්ධන දර්ශක පහක් දක්වන්න. (ලකුණු 05)

2. (i) පහත දැක්වෙන දේ සඳහා අදාළ කොට 1977න් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ පැහැදිලි කරන්න : (ලකුණු 10)
   (a) වෙළෙඳ ප්‍රතිපත්තිය
   (b) විනිමය අනුපාත ප්‍රතිපත්තිය
   (ii) ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි මෙම ප්‍රතිසංස්කරණයන්හි බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 10)

3. (i) 'ආර්ථික වර්ධනය හා දරිද්‍රතාවය අඩුවීම අතර දෘඪ සම්බන්ධතාවක් පවතී.' ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟවන්නේද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න. (ලකුණු 10)
   (ii) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩු කිරීමේදී සමෘද්ධි වැඩසටහනෙහි කාර්යභාරය විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 10)

4. (i) ආනයන ආදේශන කාර්මික ප්‍රතිපත්තිය සහ අපනයන ප්‍රවර්ධන කාර්මික ප්‍රතිපත්තිය අතර වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)
   (ii) ශ්‍රී ලංකා රජය කර්මාන්ත අංශය නැංවීම සඳහා 1977න් පසුව ගත් ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 12)

5. (i) 'ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන අනුපාතිකය අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල එම අගයට වඩා පහත්ය.' ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟවන්නේද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න. (ලකුණු 10)
   (ii) ශ්‍රී ලංකාවේ ජනගහනයේ වයස් ව්‍යුහයේ වෙනස්කම්හි ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳ රචනාවක් ලියන්න. (ලකුණු 10)

6. (i) රැකියා වියුක්තිය යන්නෙන් කුමක් අදහස් වන්නේද? (ලකුණු 05)
   (ii) ශ්‍රී ලංකාවේ ඉහළ රැකියා වියුක්තියේ ප්‍රධාන හේතු දක්වන්න. (ලකුණු 05)
   (iii) 'ශ්‍රී ලංකාවේ නිල රැකියා වියුක්ති අනුපාතය 5%ට වඩා අඩු බැවින් ශ්‍රී ලංකාව තුළ රැකියා වියුක්ති ගැටලුවක් නොමැත.' මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

7. (i) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)
(ii) විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ ශ්‍රී ලංකා රජය කෘෂිකර්මාන්තය නැංවීමට අනුගමනය කළ ප්‍රතිපත්ති මොනවාද? (ලකුණු 10)
(iii) වර්තමානයේ ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මාන්ත අංශය මුහුණ දෙන ගැටලු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

8. (i) ශ්‍රී ලංකාවේ වර්තමාන බදු ව්‍යුහය විස්තර කරන්න. (ලකුණු 05)
(ii) ශ්‍රී ලංකාවේ බදු ව්‍යුහයේ වෙනස්වීම් සඳහා හේතු වූ කරුණු යෝජනා කරන්න. (ලකුණු 07)
(iii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ගැටලු සාකච්ඡා කරන්න. (ලකුණු 08)

9. (i) ගෙවුම් ශේෂයෙහි සමස්ත ශේෂ හිඟය මඟින් ඔබ තේරුම් ගන්නේ කුමක්ද? (ලකුණු 05)
(ii) ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ගැටලුවෙහි ප්‍රතිවිපාක දක්වන්න. (ලකුණු 05)
(iii) 1977න් පසුව ගෙවුම් ශේෂ ගැටලුව විසඳීම සඳහා ශ්‍රී ලංකා රජය ගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 10)

10. ශ්‍රී ලංකාවට අදාළ කරගෙන පහත ඕනෑම හතරක් සඳහා කෙටි සටහන් ලියන්න. (කොටසකට ලකුණු 05)
(a) විනිමය අනුපාත අවප්‍රමාණය
(b) දිවි නැගුම
(c) 1970 ගණන්වල ඉඩම් ප්‍රතිසංස්කරණ
(d) කෘෂිකාර්මික ණයදීමේදී බැංකුවල කාර්යභාරය
(e) අපනයන ප්‍රවර්ධන කලාප
(f) නිරපේක්ෂ දරිද්‍රතාව හා සාපේක්ෂ දරිද්‍රතාව

---